

# මහණවීම සහ මහණවීම

## අපේ කාලේ කතන්දර



රසික සූරියආරච්චි

මා දන්නා පරිදි ලංකාවේ බෞද්ධ ශාසනයට ඇතුළත් වෙන ප්‍රධාන ක්‍රම දෙකක් ඇත.
ඉන් වඩාත් භාවිතයේ පවතින ක්‍රමය නම්, විවිධ හේතූන් මත කුඩා වයසේ පසුවන දරුවන් මහණ කරවීමයි. ඒ හේතු අතර, පන්සලේ පරම්පරාව ගෙන යාමට ලේ නෑයෙක් අවශ්‍ය වීම, දරුවා ගේ හතර කේන්ද්‍රය පාළු වී තිබීම, පන්සලේ ලොකු සාදු ගේ මිනුම් දණ්ඩට අනුව පින් පාට දරුවකු වීම, දෙමව්පියන් ගේ දුප්පත්කම, එක් දරුවෙකු මහණ කළ පිනෙන් පරම්පරාවකට ම සසරෙන් එතෙරවීමට හැකිවේ යැයි පැවතෙන විශ්වාසය යනාදිය වේ.

රජ කාලයේ දී නම් කේන්ද්‍රයේ රාජ යෝගයක් තිබේ යැයි සැලකුණු දරුවන් අනිවාර්යෙන් ම මහණ කරවූයේ ලු! ඒ, එසේ නො කළොත් තමන් ගේ බඩගෝස්තරය රැක ගැනීමට කවදත් මුල් තැන දෙන රජුන් විසින් එවැනි දරුවන් මරා දැමීමට නියමිත හෙයිනි.

කුමන හේතුවක් නිසා හෝ හයක් හතරක් නොතේරෙන දරුවන් ද, ජීවිතය ගැන වැඩි අවබෝධයක් නැති වැඩුණු ළමුන් ද, මෙලෙස ශ්‍රමණ දිවියට ඇතුළත් කරවීම හෝ ඊට අනුබල දීම මහා පාපයක් බව මගේ අදහසයි.
කෙසේ වෙතත්,ඒ ගැන සාකච්ඡා කිරීම මේ ලිපියේ අදහස නොවේ.

මහණ දිවියට ඇතුළත් වෙන දෙවන ක්‍රමය වන වැඩිහිටි වයසේ දී ඒ සඳහා පෙළඹෙන අය මා වටහාගෙන ඇති පරිදි ප්‍රධාන ධාරාවන් දෙකකට අයත් වේ.

මින් එක කොටසක් ධර්මය උගෙන, තරමක් හෝ එය අවබෝධ කරගෙන, ටික කලක් හෝ බණ භාවනාවෙන් කල් යවා පසුව මහණ දිවියට පත්වුණු අයයි. ජේ.ආර්. ජයවර්ධනගේ බාල සහෝදරයෙකු වූ අධි නීතිඥ කෝබට් ජයවර්ධන විශ්‍රාම ලැබූ පසු සේදවත්තේ ධම්මරුචි නමින් මහණ වූයේ මේ ආකාරයටයි සිතමි. තවත් උදාහරණ කොතෙකුත් ඇත.

දෙවන ධාරාව වනුයේ ජීවිතය ගැණ කලකිරී මහණ වීමට සිතා එය ක්‍රියාත්මක කරණ අයයි.
ජවිපෙ කලබල සමයේ දී ශ්‍රී ලංකා යුද හමුදාවේ බ්‍රිගේඩියර්වරයෙකුව සිටි, පසුව මානව හිමිකම් නඩුවකට ද අසුවුණු, ජවිපෙ සිරකරුවන් පුනරුත්ථාපනයට අදාළ හමුදා තනතුරක් ද දැරූ ආනන්ද වීරසේකර ද පසු කලෙක මහණ දිවියට පත්ව ඇත. ඒ තමා කල කී දේ ගැන ඇති වූ කලකිරීමක් නිසා යැයි සිතමි. ඒ ආනන්තර්ය පින් බලෙන් දෝ ඔහු අර නඩුවලින් ගැලවෙන්නට ඇතැයි ද සිතමි.

කුඩා කල මහණ වූ සිරිසාගරලා, පිරිවෙන් අධ්‍යාපනය අවසානයේ විශ්ව විද්‍යාලයට පැමිණි පසු සිවුරු අත්හැර නන්දනලා වීම සාමාන්‍යයෙන් සිදුවේ. නමුත්, පිටිදුවේ සිරිධම්ම හෙවත් සමන්තභද්‍ර මහණ වී ඇත්තේ විශ්ව විද්‍යාලයේ දී බව ද, ඒ රට පනින්නට වීසාවක් ගන්නට කළ උප්පරවැට්ටියක් බව ද, නමුත් පසුව ඔහු මහණකමේ දිගටම රැඳුණු බව ද, කලකට පෙර අපට අසන්නට ලැබුණි.

කෙසේ වෙතත්, මා මේ සැරසෙන්නේ ඒ කිසිවෙකු ගැන සාකච්ඡා කිරීමට නොව උසස් පෙළ පන්තියේ සිටි මිතුරෙකු පිළිබඳ දුක්බර කතාවක් ඔබට කියන්නටයි.

ගලහිටියාව මධ්‍යම විද්‍යාලයෙන් නමවෙනි ශ්‍රේණිය සමත් වූ මම දහවෙනි ශ්‍රේණිය සඳහා මරදානේ ආනන්ද විද්‍යාලයට ඇතුළත් වීමි. ගාල්ලේ මහින්දේ සිට කොළඹ මහානාමය දක්වා ද, රත්නපුර සීවලියේ සිට මහනුවර ශාන්ත අන්තෝනිය දක්වා ද, බදුල්ලේ පාසල්වල සිට අවිස්සාවේල්ලේ පාසල් දක්වා ද රටේ හය දිසාවෙන් ම පාහේ පැමිණි සිසුහූ හතළිස් පස් දෙනෙකු පමණ මරදාන පාරට සමාන්තරව පිහිටි තුන් මහල් ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ පිහිටි අපේ 10-9 පන්තියට ගාල් කර සිටියහ.

අපේ කතානායක නිල්මිණී මහීලාල් පැමිණ සිටියේ මිනුවන්ගොඩ නාලන්දාවේ සිට ය. එසේ වුවද, ඔහු පාසලට පැමිණියේ මහරගම සිට පාසල් බසයෙනි. කෙමෙන් කෙමෙන් මා දැනගත් කරුණු වූයේ, දෙදෙනාම ගුරුවරුන් වූ නිල්මිණී මහීලාල් ගේ දෙමව්පියන් වාසය කළේ වයඹ පළාතේ දුර බැහැර ප්‍රදේශයක බවත්, අධ්‍යාපනය වෙනුවෙන් ඔහු කුඩා කාලයේ සිට ජීවත් වී ඇත්තේ ඔහු ගේ නැන්දනියන් ගේ නිවෙස්වල බවත් ය.

එය ඔහු ගේ කැමැත්ත මත සිදුවූවක් නොවුණු බව ද, මහරගම වාසය ඔහු එතරම් ප්‍රිය නොකළ බව ද මට ක්‍රමයෙන් වැටහුණි.

නමවෙනි ශ්‍රේණියේ විභාගයේ දී ඔහු ලබා තිබුණු ප්‍රතිඵල මත, නිල්මිණී මහීලාල් මට වඩා දක්ෂ සිසුවෙකු යැයි මට හැඟී ගොස් තිබුණු අතර, පන්තියේ දී ඔහු උනන්දුවෙන් ඉගෙනීමේ කටයුතුවල නිරත වෙනු සාමාන්‍යයෙන් දක්නට ලැබුණි.
අප එකොළොස්වෙනි ශ්‍රේණියේ දී, ටියුෂන් යෑම ඇරඹුවත්, නිල්මිණී මහීලාල් පාසලේ ඉගෙනීමෙන් පමණක් සෑහීමට පත්වෙන බව පෙනුණි. මා මුලින් සිතුවේ ඒ ඔහු ගේ ඉගෙනීමට ඇති දක්ෂතාව නිසා විය යුතුය කියා වුණත්, එයට හේතුව බොහෝවිට මුදල් පිළිබඳ ප්‍රශ්නයක් දැයි මට පසුව සැකයක් ද ඇතිවුණි.

ඉංජිනියරිං බ්ලොක් එක නමින් ඒ දිනවල හැඳින්වූ ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ පැවැත්වුණු අපප කොටු වී සිටි ගණිත ධාරාවේ 11එම්4 පන්තියේ දී පනස් දෙනෙකුගෙන් පමණ සමන්විත වූ සිසුන් අතර පන්ති කාමරයේ අවසාන පේළියේ වසරක්ම ජීවිතය ගෙවා චාටර් වී සිටි මම, දොළොස්වෙනි ශ්‍රේණිය සඳහා පන්ති දෙකක සිසුන් එකට එකතු කර පස් මහල් විද්‍යා ගොඩනැගිල්ලේ යට මාලයේ ශාලාවට දැක්කූ දිනයේ වහා දිවගොස් ඉදිරිපස පේළියේ අසුන් ගත්තද, නිල්මිණී මහීලාල් පසුපස පේළියක් තෝරාගත් බව පෙනුණි.

අවාසනාවකට මෙන්, සාමාන්‍යයෙන් නිහඬ සිසුවෙකු වූ නිල්මිණී මහීලාල් ද, ඔහු ඒ දිනවල ඇසුරු කළ එලෙසම කඩේ වසා සිටි පසුපස පේළියක සිටි මිතුරන් කිහිප දෙනා ද, උසස් පෙළ සමත් වූයේ නැත.

ප්‍රාදේශීය විද්‍යාලයක සිට ඉතා ඉහළ ප්‍රතිඵල ලබා කොළඹ පාසලකට පැමිණ එසේ විභාගය අසමත් වීම, දෙමව්පියන්ට මෙන්ම සිසුනට ද දරාගත හැකි දෙයක් නොවෙන බව අමුතුවෙන් කිව යුතු නැත.

කෙසේ වෙතත්, එතැන් පටන් නිල්මිණී මහීලාල් මගේ දර්ශනපථයෙන් දුරස් වී ගියේය. ගතවුණු දශක කිහිපය තුළ ම මා ඔහු හෝ ඔහු ගේ ඡායාරූපයක් හෝ දැක නැත.

විශ්ව විද්‍යාලයේ අවසන් වසරේ දී මුණ ගැසුණු නවක ශිෂ්‍යාවකගෙන් ඇය ගේ ගම කොහේදැයි විමසූ විට ලැබුණු පිළිතුර නිසා නිල්මිණී මහීලාල් නැවතත් මගේ මතකයට ආවේ ය.
ඇය ඔහු පිළිබඳව දැන සිටියා ය.

නමුත් මට ඇයගෙන් ලැබුණු එකම ආරංචිය වූයේ ඔහු ඒ වෙන විට මහණ දිවියට ඇතුළත් වී සිටි බවයි.

තවත් වසර කිහිපයකට පසු නැවතත් ඒ විශ්ව විද්‍යාල මිතුරිය අහම්බෙන් මෙන් මුණ ගැසුණු විට දැන ගන්නට ලැබුණේ නිල්මිණී මහීලාල් සිවුරු හැර දමා සිය දිවි හානිකරගෙන ඇති බවයි.
ඒ හැර වෙනත් කිසිදු විස්තරයක් ඇය ද දැන සිටියේ නැත.

පාසලේ උසස් පෙළ හදාරා විභාගයට පෙනී සිටි කාලය සහ නිල්මිණී මහීලාල් ගේ මරණය සිදු වී ඇති වසර දහයකට වැඩි කාලය අතරතුර කුමක් සිදුවී දැයි මම අදත් නොදනිමි.

අසහනය, ආතතිය, විෂාදය, ඉච්ඡාභංගත්වය යන මෙකී නොකී හේතු කාරණා රැසක් ඒ අවාසනාවන්ත අවසානයට හේතුවෙන්නට ඇත.
මොරටුව විශ්ව විද්‍යාලයේ උගත් සිසුවියක් පිළිබඳව මේ හා සමාන්තරව ඇදෙන කතාවක් පසුගිය දිනයක ඉන්ටර්නෙට් හි බ්ලොගයකින් කියවද්දී නිල්මිණී මහීලාල් පිළිබඳ මගේ පැරණි මතකය යළිත් මගේ උඩු සිත පාරන්නට විය.
අවසානයේ මට සිතුණේ, ගිහි ජීවිතය ගැන කලකිරී, ඒ ජීවිතයේ ඇති ප්‍රශ්නවලින් මිදීමේ විකල්පයක් ලෙස පැවිදි ජීවිතයට ඇතුළත් වීම යනු මුලාවක් පමණක් ම නොවේදෝ කියා ය.

පැවිදිවිය යුත්තේ ජීවිතය ගැන කලකිරී ප්‍රශ්නවලින් පලායාම පිණිස නොව ජීවිතය ජය ගැනීම පිණිස ය.

මහණවීම සහ මහණවීම අතර වෙනස එයයි!

## ඇවිළිණී කුමරි බඹසර

**සිනුවර වෙසෙන කවියෙකු වන ඥානතිලක හේවාගමගේ ලියූ ඇවිළිණී කුමරි බඹසර පද්‍ය කාව්‍යය ජනගත කිරීමේ උත්සවය පසුගිය ද පවත්වන්නට යෙදුණි. චුල්ල ධනුද්ධර ජාතකය ඇසුරෙන් සිංහල සම්ප්‍රදායානුකූල සඳැස් කවි ආකෘතිය උපයෝගී කර ගනිමින් රචනා කර ඇති මෙම කෘතිය සර්ග විසි පහකට බෙදුණු කවි එකසිය හැටකින් සමන්විත වේ.**
ඡායාරූප- දසුන් ගිනිගේ





